Australian Government
Department of Home Affairs

# ප්‍රාන්ත සහ දේශභූමිවල ඇතුළු වීමේ අවශ්‍යතා

## දළ විශ්ලේෂණය

ඕස්ට්‍රේලියාවේ සෑම ප්‍රාන්තයකටම සහ දේශභූමියකටම ඔබ අනුගමනය කළ යුතු ඇතුළු වීමේ විධිවිධාන සහ අවශ්‍යතා ඇත. **එක් එක් ප්‍රාන්තයේ සහ දේශභූමියේ අවශ්‍යතා වෙනස් වන අතර කෙටි දැනුම්දීමකින් වෙනස් විය හැක.**

ඔබ සංචාරය කිරීමට සැලසුම් කරන ප්‍රාන්ත සහ දේශභූමි වෙත ඇතුළු විය හැකිදැයි ඔබ පරීක්ෂා කළ යුතුය. සමහර ප්‍රාන්ත සහ දේශභූමිවල ජාත්‍යන්තර සංචාරකයින් සඳහා අමතර නිදහස් කිරීම් අවශ්‍ය වේ.

ඔබට ඇතුළු වීමට ඉඩ නොදිය හැකිය, නැතහොත් නිරෝධායනයට ඇතුළු වීමට අවශ්‍ය විය හැකිය. ඔබට අදාළ වන සංචාරක සීමා හා අවශ්‍යතාවලට අනුගත වීම ඔබේ වගකීමකි. ඔබ ඒවාට අනුගත නොවන්නේ නම්, ඔබට සිර දඬුවම් සහ සැලකිය යුතු දඩ මුදල් ඇතුළු බරපතල දඬුවම්වලට මුහුණ දීමට සිදු විය හැක.

විශේෂයෙන්, ඔබ පහත සඳහන් ඒවාට අදාළව ප්‍රාන්ත හෝ දේශභූමි අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කළ යුතුය:

- දේශසීමා ප්රවේශ ලියාපදිංචි කිරීමේ ආකෘති පත්ර
- නිරෝධායන
- ඔබ පැමිණි පසු පරීක්ෂණ අවශ්‍යතා
- දේශීය එන්නත්කරණ අවශ්‍යතා.

ප්‍රාන්ත හා දේශභූමි සඳහා ඔබට බහු ඇතුළු වීමේ හෝ ලියාපදිංචි පෝරම පිරවීමට සිදු විය හැක.

# ළමුන්

වයස අවුරුදු 12 ට අඩු ළමයින්ට සම්පූර්ණයෙන්ම එන්නත් කළ වැඩිහිටි පවුලේ සාමාජිකයන් සමග ගමන් කරන විට එන්නත් කළ සංචාරකයින් මෙන් එකම විධිවිධාන යටතේ ගමන් කළ හැකිය. වයස අවුරුදු 12 ට අඩු ළමුන් සංචාරක අරමුණු සඳහා සම්පූර්ණයෙන්ම එන්නත් කර ඇති ලෙස සලකනු ලැබේ.

සමහර ප්‍රාන්ත සහ දේශභූමි වයස අවුරුදු 12-17 අතර එන්නත් නොකළ හෝ අර්ධ වශයෙන් එන්නත් කළ දරුවන්ට සම්පූර්ණයෙන්ම එන්නත් කළ වැඩිහිටියෙකු සමග ගමන් කිරීමට ඉඩ සලසයි.

**දරුවෙකු එන්නත් නොකළ වැඩිහිටි පවුලේ සාමාජිකයන් සමග ගමන් කරන්නේ නම්, මුළු පවුලේ කණ්ඩායමම පැමිණෙන මගී සීමාවලට** යටත් විය හැකි අතර ප්‍රාන්ත සහ දේශභූමිවල ඇතුළු වීමේ අවශ්‍යතා සපුරාලිය යුතුය. ඔබට නිරෝධායනයට ලක් වීමට අවශ්‍ය විය හැක. ඔබ මෙය හා ඔබ සංචාරය කරන සියලුම ප්‍රාන්ත සහ දේශභූමිවල අවශ්‍යතා ද පරීක්ෂා කළ යුතුය.

පැමිණෙන මගී සීමා පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා, යටිතල පහසුකම්, ප්‍රවාහන, ප්‍රාදේශීය සංවර්ධන සහ සන්නිවේදන දෙපාර්තමේන්තුව [COVID-19 සහ මගීන්] බලන්න.

# දේශසීමා ප්රවේශ ලියාපදිංචි කිරීමේ ආකෘති පත්ර

සමහර ප්‍රාන්ත සහ දේශභූමිවලට ජාත්‍යන්තර සංචාරකයින් පැමිණීමට පෙර අමතර පෝරම සහ ලියකියවිලි සම්පූර්ණ කිරීමට අවශ්‍ය වේ. මෙම තොරතුරු ප්‍රාන්ත සහ දේශභූමි ඔබේ පැමිණීම සඳහා සූදානම් කිරීමට සහ සැලසුම් කිරීමට උදවු කරයි. ප්‍රාන්ත සහ දේශභූමි සඳහා ඔබේ ඇතුළු වීම අනුමත කිරීමට ද අවශ්‍ය විය හැකිය.

ප්‍රාන්ත සහ දේශභූමි ලියාපදිංචි කිරීමේ පෝරම ඩිජිටල් මගී ප්‍රකාශනයට (DPD) **අමතරව බව** සලකන්න. ඔබ ඕස්ට්‍රේලියාවට ඇතුළු වූ පසු (ප්‍රාදේශීය සංචාර) ඔබ ගමන් කරන ප්‍රාන්ත හෝ දේශභූමි සඳහා අමතර ප්‍රවේශ හෝ ලියාපදිංචි කිරීමේ පෝරම සම්පූර්ණ කිරීමට ද ඔබට අවශ්‍ය විය හැකිය.

# නිරෝධායන

නිරෝධායන අවශ්‍යතා තීරණය කිරීම සහ කළමනා කිරීම සඳහා රාජ්‍ය සහ දේශභූමි වගකිව යුතුය. ඔබ ඕස්ට්‍රේලියාවට ඇතුළු වූ පසු (ප්‍රාදේශීය සංචාර) ඔබ පැමිණෙන ප්‍රාන්තයේ හෝ දේශභූමියේ අවශ්‍යතා සහ ඔබ ගමන් කරන ප්‍රාන්ත සහ දේශභූමිවල අවශ්‍යතාවලට අනුකූල විය යුතුය.

ඔබ ඔබේ ගුවන් යානය වෙන් කරවා ගැනීමට පෙර, ඔබ අදාළ [ප්‍රාන්ත සහ දේශභූමි නිරෝධායන අවශ්‍යතා] සියල්ල පරීක්ෂා කරන බවට සහතික වන්න.

විදේශවල සිට ඕස්ට්‍රේලියාවට පැමිණෙන සම්පූර්ණයෙන්ම එන්නත්කළ සංචාරකයින්ට වෙනස් කළ හෝ අඩු කළ නිරෝධායන සැලසුම්වලට ලක් වීමට සිදු විය හැක. නිරෝධානය අවශ්‍යතා කෙටි දැනුම්දීමකින් වෙනස් විය හැක.

දරුවෙකු එන්නත් නොකළ වැඩිහිටි පවුලේ සාමාජිකයන් සමඟ ගමන් කරන්නේ නම්, මුළු පවුලම ඕස්ට්‍රේලියාවට පැමිණෙන ප්‍රාන්තය හෝ දේශභූමිය සඳහා නිරෝධායනයට සහ මගී සීමාවලට යටත් වේ.

සමහර ප්‍රාන්ත සහ දේශභූමිවල, වයස අවුරුදු 12 සිට 17 දක්වා එන්නත් නොකළ හෝ අර්ධ වශයෙන් එන්නත් කර ඇති දරුවන්ට නැවත ඕස්ට්‍රේලියාවට පැමිණීමෙන් පසු දින 7ක් පාසල් යාමට නොහැකි වන බව සලකන්න. ඔවුන්ට පැමිණීමෙන් පසු දින 14ක් වනතුරු ළමා සුරැකුම් මධ්‍යස්ථාන, වයස්ගත සත්කාරක නේවාසික පහසුකම්, ආබාධිත සත්කාරක පහසුකම් හෝ රෝහල් වැනි වෙනත් ස්ථානවලට පැමිණීමට ද නොහැකි වෙයි. හදිසි වෛද්‍ය ප්‍රතිකාර සඳහා නිදහස් කිරීම් අදාළ වේ. ප්‍රාන්ත හා දේශභූමිවල නිරෝධායන අවශ්‍යතා බලන්න.

## පැමිණීමෙන් පසු COVID-19 පරීක්ෂණ අවශ්‍යතා

බොහෝ ප්‍රාන්ත සහ දේශභූමිවල ඔබ පැමිණීමෙන් පසු ඉක්මනින් COVID-19 පරීක්ෂණයක් කිරීමට අවශ්‍ය වේ.

ඔබ පැමිණෙන, සංක්‍රමණය වන සහ ගමන් කරන සියලුම ප්‍රාන්ත සහ දේශභූමි සඳහා පරීක්ෂණ අවශ්‍යතා ඔබ පරීක්ෂා කළ යුතුය.

පැමිණීමෙන් පසු ඔබේ පරීක්ෂණ අවශ්‍යතා ඔබේ ඕස්ට්‍රේලියාවට පියාසර කිරීමට පෙර සෘණ COVID-19 පරීක්ෂණයක් සැපයීමේ අවශ්‍යතාවට **අමතරව** බව **සලකන්න**.

## දේශීය එන්නත්කරණ අවශ්‍යතා

ඇතැම් ප්‍රාන්ත හා දේශභූමිවලදී සමහර ස්ථාන සහ සේවාවන් වෙත ප්‍රවේශ වීමට (උදාහරණය ලෙස, අවන්හල්, අත්‍යවශ්‍ය නොවන සිල්ලර වෙළඳසැල්, චිත්‍රපට ශාලා, විනෝද උද්‍යාන හෝ මංගල සහ අවමංගල්‍ය කටයුතුවලට) ඔබේ COVID-19 එන්නත් 'යාවත්කාලීන' කර තිබීමට අවශ්‍ය විය හැක.

ඔබ ඕස්ට්‍රේලියාවට ඇතුළු වීමට 'සම්පූර්ණයෙන් එන්නත් කළ' අවශ්‍යතා සපුරාලනු ලැබුවද, ඔබ දේශීය තත්ත්ව සඳහා 'යාවත්කාලීන' නොවිය හැක.

ඕස්ට්‍රේලියාවට පැමිණෙන ජාත්‍යන්තර සංචාරකයින් ඔවුන්ගේ එන්නත් සමග යාවත්කාලීනව තබා ගැනීම සඳහා ඕස්ට්‍රේලියාවේ බූස්ටර එන්නත් වැඩසටහනට ප්‍රවේශ වීමට දිරිමත් කරනු ලැබේ. ඕස්ට්‍රේලියානු වීසා බලපත්‍රලාභීන් ඇතුළුව ඕස්ට්‍රේලියාවේ සිටින සෑම කෙනෙකුටම COVID-19 එන්නතක් නොමිලේ ලබා ගත හැක.

## ඕස්ට්‍රේලියාවේ ගෘහස්ථ සංක්‍රමණ ගමන්

ඔබ සංක්‍රමණය වන ප්‍රාන්ත සහ දේශභූමි සඳහා නිරෝධායන අවශ්‍යතා අනුගමනය කළ යුතුය. ඔබට හෝටල් නවාතැන්වල රැඳී සිටීමට අවශ්‍ය විය හැකි අතර, ඔබ ඉදිරි ගුවන් ගමන සඳහා රැඳී සිටින අතරතුර, ඔබගේ නවාතැන් සඳහා ගෙවීමට සිදු විය හැක.

## වැඩිදුර තොරතුරු

නිරෝධායනය, ඔබ පැමිණි පසු COVID පරීක්ෂාව සහ දේශීය එන්නත්කරණ ප්‍රමිති ඇතුළුව, ප්‍රාන්ත සහ දේශභූමි අවශ්‍යතා පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා, අදාළ ප්‍රාන්ත සහ දේශභූමි නිරෝධායන අවශ්‍යතා පරීක්ෂා කරන්න.